# වාණිජ ධාරා

( අධ්‍යාපන කාර්යාලය  බලංගොඩ )

# ව්‍යාපාර අධ්‍යනය

## නිපුනතාවය 7, මුදල් හා මූල්‍ය ආයතන

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ආර් එම් ඒ ජේ බණ්ඩාර ර/ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය බලංගොඩ

**තාක්ෂණ සහය පරිගණක සම්පත් මධ්‍යස්ථානය කුරුවිට**

**ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.**

# ගනුදෙනු පහසුකර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි.

* මුදල් යන්න අර්ථ දක්වයි.
* හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
* මුදලේ කාර්යයන් හඳුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
* හොඳ මුදලක ලක්ෂණ පෙන්වා දෙයි.
* හුවමාරුවේ දී භාවිත වන විවිධ මුදල් වර්ග පැහැදිලි කරයි.

# මුදල් යන්න අර්ථ දක්වයි.

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකයි.

# හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

- අතීතයේ මුදල් නොමැතිව සිදු වූ සෘජු හුවමාරුව භාණ්ඩ හුවමාරුව නම් විය.
- භාණ්ඩ හුවමාරුවේ දී විවිධ දුෂ්කරතා පැවතිණි.
- එබැවින් භාණ්ඩ හුවමාරුව වෙනුවට සෑම දෙනාම පිළිගන්නා පොදු මාධ්‍යයක අවශ්‍යතාව දැණුනි.
- එම හුවමාරු මාධ්‍ය මුදල් ලෙස හැඳින්විය.
- ඒ අනුව හුවමාරුව සඳහා මුදල් අවශ්‍ය බව පැහැදිලි වේ.

# මුදලේ කාර්යයන් හදුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.

විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (A medium of exchange)

වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම (standard of value)

වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම (store of value)

විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (Defferred payments)'

## විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. නැතහොත් භාණ්ඩ හා සේවාවල මිල ගෙවනුයේ මුදල් මගිනි. නිදසුන් : රු. 30,000 ක ජංගම දුරකථනයක් මිල දී ගැනීම.

# වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

**භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීමයි.**

**මෙය මිල** (price) **නම් වේ.**

**මෙ මගින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය ගිණුම් ඒකකයක්** (unit of Account) **ලෙස ද හඳුන්වයි.**

**නිදසුන් : සපත්තු ජෝඩුවක් රු. 1999.90 ක් ලෙස මිල කිරීම**

# වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

මුදල් රැස් කර තබා ගත හැකි ය. කාසි හා නෝට්ටු යල් පැනීමකනි තොරව ක්ෂය වීමකින් තොර ව රැස් කර තබා ගනිමින් අනාගතයේ දි භාණ්ඩ හා සේවා මිලට ගැනීමට භාවිත කළ හැකි ය.

නිදසුන් : රු. 10,000 ක මුදලක් ඉතිරි කිරීම.

# විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකි ය.

එනම් ඉදිරි දිනයක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි විමයිග

නිදසුන් : 2016 ජනවාරි මස රු.5000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා 2016 මාර්තු මස මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

## හොඳ මුදලක ලක්ෂණ .

- පොදු පිළිගැනීමක් තිබීම.
- කල්පැවැත්මක් තිබීම.
- අනුකරණයේ දුෂ්කරතාව.
- පහසුවෙන් ගෙන යා හැකි වීම.
- පහසුවෙන් හදුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව.
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම.

# මුදල් වර්ග

## ව්‍යවහාර මුදල් ( currency)

මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හදුන්වයි. ව්‍යවහාර මුදල් වලංගු මුදල් ලෙස ද  හඳුන්වන අතර මේවායේ ද්‍රවශීලතාව 100% කි.

නිදසුන් : කාසි හා නෝට්ටු

# බැංකු මුදල් (Bank Money)

වාණිජ බැංකු පවත්වා ගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර  මුදල් මෙන් ද්‍රවශීලතාව 100% ක් ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත වේ. නිදසුන් : වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු

## ආසන්න මුදල් (Near Money)

ව්‍යවහාර මදුල් මන් 100% ක් ද්‍රවශීලතාවෙන් යුක්ත නොවූල එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම් ය.

නිදසුන් : වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැනපත්තු, භාණ්ඩාගාර බිල්පත් , වාණිජ පත්‍රිකා

## විද්‍යුත් මුදල් (E-money)

**තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වී ඇති දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ද ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් යග**

**උදා: හර කාඩ්පත්/ණය කාඩ්පත්/පෙර ගෙවුම් කාඩ්පත්**

# කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසුකිරීම සඳහා වන සේවාවන් (පහසුකම්)

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර.
- ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර.
- චෙක්පත් තැන්පතු යන්ත්‍ර.
- වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල.
- ටෙලි බැංකු පහසුකම්.
- අන්තර්ජාල බැංකු කටයුතු.
- ටෙලිවිෂන් බැංකු පහසුකම්.

# ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන මූල්‍ය ආයතන

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පහත සඳහන් ආකාරයට වර්ග කරයි.

- බැංකු අංශය
  - ශ්‍රී ලංකා මහ බැංකුව
  - බලපත්‍රලාභී වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු

- තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
  - බලපත්‍රලාභී මුදල් සමාගම්
  - සමූපකාර ග්‍රාමීය බැංකු
  - සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති

# විශේෂිත මූල්‍ය ආයතන

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවන්
- කොටස් තැරැව්කරුවන්
- ඒකක භාර/ ඒකක භාර කළමනාකරණ සමාගම්
- වෙළෙඳපොළ අතරමැදියන්
- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

# ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

- රක්ෂණ සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
- අනුමත විශ්‍රාම හා අර්සාධක අරමුදල්
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්

# මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වය

බලපත්‍රලාභී වාණිජ බැංකු ( Licensed Commercial Banks )

ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාම හා මුදල් මැවීමට හැකියාව ඇති මූල්‍ය ආයතන විශේෂයයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් මණ්ඩලයේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇති අතර මේවායින් කිහිපයක් රාජ්‍ය අංශයට ද බහුතරයක් පෞද්ගලික අංශයට ද අයත් වේ.

# බලපත්‍රලාභී විශේෂිත බැංකු ( Licensed Specialized Banks)

බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතන විශේෂයකි. මෙහි ඇති විශේෂත්වය නම් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට අවසර නො මැති වීමයි. එහෙත් ඉතිරි කිරීමේ ගිණුම් හා කාලීන තැන්පත් ගිණුම් වශයෙන් මහජනතාවගෙන් මුදල් තැන්පත් භාර ගැනීමට අවසර ඇත.

# බලපත්‍රලාභී මුදල් සමාගම් (Finance Companies)

කාලීන තැන්පතු භාර ගැනීම හා එම මුදල් මත ණය දීම සහ ආයෝජනයට පහසුකම් සලසන, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති පොදු සමාගම් විශේෂයකි.

# සමුපකාර ග්‍රාමීය බැංකු ( Co-operative Rural Banks)

සාමාජික හා සාමාජික නො වන්නන්ගෙන් කාලීන හා ස්ථාවර තැන්පත් ලබා ගැනීම සහ සිය සාමාජිකයින්ට ණය සැපයීම ප්‍රධාන කාර්යය කොටගත් ආයතනයකි. මෙය විවිධ සේවා සමුපකාර සමිතිවල බැංකු ව්‍යාපාරික අංශයයි.

නිදසුන් : මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ සමුපකාර ග්‍රාමීය බැංකුව

සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය (සණස)

ඉතිරි කිරීම් දිරිමත් කිරීමත්, සාමාජිකයින්ට ණය සැපයීමත් අරමුණු කර ගෙන සාමාජිකයින්ගේ ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන, සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියාපදිංචි කළ යුතු ආයතන විශේෂයකි.

නිදසුන් : නෙලුම්කුළම සණස සමිතිය

අත්තනගල්ල සණස සමිතිය

## විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (Special Leasing Companies)

කල්බදුකරණය සඳහා ම මහ බැංකුවේ ලියාපදිංචි වූ සමාගම් විශේෂයකි. ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත කරගත් මූල්‍ය ආයතන විශේෂයකි. අදාළ වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම මෙම ආයතනවල ප්‍රධාන ආදායම වේ.

# ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers )

රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළයි. මෙම ප්‍රාථමික වෙළෙඳපොළට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ.

# කොටස් තැරැව්කාර සමාගම් (Share Brokers)

සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන තැරැව්කාර සමාගම් ලෙස හැඳින්වේ. කොටස් තැරැව්කරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු ය.

## ඒකක භාර /ඒකකභාර කළමනාකරණ සමාගම් (Unit Trust / Unit Trust Management Companies)

ඒකක භාරයක් යනු ආයෝජකයින්ට ඒකක (Units) විකිණීමෙන් රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කළඹක යොදවනු ලැබේ. එහි ප්‍රතිලාභ ඒකක භාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයින් අතරේ බෙදා හරිනු ලැබේ.

ඒකක භාරයක් පාර්ශ්ව තුනකින් සමන්විත වේ.

1. ඒකක භාරකරු
2. අරමුදල් කළමනාකරණ සමාගම
3. ඒකක හිමියන් හෙවත් ආයෝජකයින්

Activ

# වෙළෙඳපොළ අතරමැදියන් : ( Market Intermidieries)

ප්‍රාරක්ෂකයින් , ආයෝජන කළමනාකරුවන් සහ ආන්තික සැපයුම්කරුවන් මෙයට ඇතුළත් වන අතර මූල්‍ය උපකරණ වෙළෙඳාම් කිරීමේ අතරමැදියන් ලෙස මොවුන් කටයුතු කරයි. මූල්‍ය උපකරණ විකුණා දීමේ සේවය සඳහා සේවා ගාස්තු, මිල දී ගන්නන්ගෙන් සහ විකුණන්නන්ගෙන් අයකර ගනී.

## ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture Capital Companies )

නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන ආයතන විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිල දී ගැනීම වැනි කටයුතුවල දී අරමුදල් සපයයි. මීට අමතර ව කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලය කිරීම ආදියෙහි ද යෙදේ.

# රක්ෂණ සමාගම් (Insurance Companies)

රක්ෂණ සමාගම්වල විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මගින් ගොඩනැගෙන අරමුදල් මූල්‍ය වෙළෙඳපොළ ණය දීම හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයක නිරත වන ආයතන වේ.

අර්ථසාධක හා විශ්‍රාම අරමුදල්

රාජ්‍ය කළමනාකාරිත්වයෙන් හා පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් විශ්‍රාම අරමුදල් හා අර්ථසාධක අරමුදල් පවතී.

# ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය.

# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීම

- 1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 වෙනි දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරනු ලබන කේන්ද්‍රීය ආයතනය වේ. එහි ආරම්භක අධිපතිවරයා වූයේ ජෝන් එක්ස්ටර් මහතා ය.

- පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මගින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කෙරෙන අතර, එම මුදල් මණ්ඩලය, මහ බැංකු අධිපති, මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා පත්කළ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

Activate Windows
Go to Settings to activate Win

# ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු

**ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම**

දේශීය මුදලේ අගය ස්ථාවර ව පවත්වා ගැනීම හෙවත් සුරක්ෂිත කිරීම මිල ස්ථායීතාව වේ. මේ තුළින් උද්ධමන හා අවධමන තත්ත්වයන්ගෙන් තොර ව ආර්ථිකය පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. උද්ධමනය අඩු මට්ටමක පවතින විට ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වේ. තිරසර ආර්ථික වර්ධනයක් හා ඉහළ සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වේ.

**මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම**

ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ලෙස හැඳින්වේ. එනම් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව ඇති කිරීම, ස්ථායීතාවට එල්ල විය හැකි තර්ජන හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම තුළින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමේ හැකියාව ඇත. මෙ මගින් තැන්පත්කරුවන්ට හා ආයෝජකයින්ට යන දෙපාර්ශ්වයට ම හිතකර වාතාවරණයක් උදා කෙරේ.

# ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්

මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්

- මුදල් ප්‍රතිපත්ති මෙහෙය වීම
- විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙය වීම
- ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
- බැංකු හා බැංකු නො වන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
- රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම
- මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වා ගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළෙඳුන්ට නිෂ්කාශන සහ පියවීමේ පහසුකම් සැපයීම

මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන්

- රාජ්‍ය ණය කළමනාකරණය
- විදේශ විනිමය පාලනය
- කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
- සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය

Activate Windows

# ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය

- ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය - ස්ලිප්ස් (Sri Lanka Inter - Bank Payment System - SLIPS)
- ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය - ස්විෆ්ට් සන්නිවේදන ජාලය - (SWIFT - Sri Lanka Worldwide Inter Bank Financial Telecommuncaition )
- තත්කාලීන දළ පියවීම් පද්ධතිය - (RTGS - Real Time Gross Settlement system)
- ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය - (SSDS - Scriptless Securites Depository System)

වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු හා සපයන ණය ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට හා වර්ධනයට කරන බලපෑම

- වාණිජ බැංකු පවත්වා ගෙන යනු ලබන විවිධ තැන්පතු වර්ග හඳුන්වයි.
- වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු අතර සමාන අසමානකම් සන්සන්දනය කරයි.
- වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- වාණිජ බැංකු සපයන ණය වර්ගීකරණය කරයි.

## වාණිජ බැංකු පවත්වා ගෙන යනු ලබන විවිධ තැන්පතු වර්ග

- **ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු): (Current Accounts)**

  චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් ඇති, ශේෂය මත පොළී හිමි නො වන ගිණුම් වර්ගයකි. බැංකු අයිරා පහසුකම් සැලසෙන අතර ටෙලර්පත් භාවිතයෙන් ගනුදෙනු කළ හැකි ය.

- **ඉතිරි කිරීමේ තැන්පතු : (Savings Accounts )**

  ඉතිරි කිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වර්ගයට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පත්කරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම කළ හැකි ය. ටෙලර්පත් මගින් ද ගනුදෙනු කළ හැකි ය.

- **ස්ථාවර තැන්පතු: (Fixed Deposits )**

  නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළියක් යටතේ තැන්පත් කිරීමකි. ඉතිරි කිරීමේ තැන්පතුවලට සාපේක්ෂ ව ඉහළ පොළියක් හිමි වේ.

වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.

- චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
- ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
- නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
- අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
- බැංකුව සමග කළ ගනුදෙනුවල වාර්තාවක් ලබා ගත හැකි වීම (බැංකු ගිණුම් ප්‍රකාශය )

## වාණිජ බැංකු සපයන ණය වර්ගීකරණය කරයි.

- අයිරා පහසුකම්
- ණය
  - ව්‍යාපාරික ණය
  - පාරිභෝගික ණය

# වාණිජ බැංකු සපයන සේවා

**නියෝජිත සේවා :**
වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවල දී ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි.
නිදසුන් :

- සුරැකුම්පත් මිලයට ගැනීම හා විකිණීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම

- **විද්‍යුත් බැංකු සේවා ( E- Banking)**
  අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම විද්‍යුත් බැංකු සේවා ලෙස හඳුන්වයි. එවැනි පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

  - **හෝම් බැංකින් : ( Home Banking)**
    තම පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලය හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිත කොට ස්වයංක්‍රීය ව බැංකු පහසුකම් ලබා ගැනීම මෙහි අදහසයි.

  - **දුරකථන බැංකු සේවා (Tele Banking)**
    ගනුදෙනුකරු බැංකුව වෙත නො ගොස් තම දුරකථනය භාවිත කිරීමෙන්

- **උකස් සේවා :**
  ස්වර්ණාභරණ ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම වාණිජ බැංකු විසින් සිදු කරන වැදගත් සේවාවකි.

- **සුරක්ෂිතාගාර පහසුකම් :**
  පුද්ගලයින්ගේ රත්, රිදී, මුතු, මැණික් ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කර දීම වාණිජ බැංකු විසින් සිදු කරයි. මේ සඳහා වාණිජ බැංකුවල විශේෂිත සේප්පු වෙන් කර ඇත.

- **විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම**
  විනිමය පාලන නියමයන් යටතේ ගනුදෙනුකරුවන්ගේ විදේශ මුදල් මිලට ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් වාණිජ බැංකු විසින් සිදු කරයි.

- **ණයපත් සේවාව :**
  කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි. ණයපත් මගින් යම් සීමාවක් දක්වා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාව ද ඇත.

- **මුදල් ප්‍රේෂණ කටයුතු :**

  ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම මින් අදහස් වේ. විදේශයක සිටින පුද්ගලයෙකුට මුදල් පැවරීම මෙන් ම, විදේශයක සිටින පුද්ගලයින්ගෙන් ලැබෙන මුදල් රැස් කිරීම ද මේ යටතේ සිදු කෙරේ.

- **සංචාරක චෙක්පත් නිකුත් කිරීම :**

  දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරී ව සිදු කිරීම සඳහා භාවිත කෙරෙන චෙක්පත් විශේෂයකි. සංචාරක චෙක්පත් , පොදුවේ පිළිගන්නා මුදල් වර්ගවලින්, විවිධ වටිනාකම් යටතේ නිකුත් කරයි. තමන් සතු මුදල් බැංකුවට ලබා දී එම වටිනාකමට බැංකුවෙන් සංචාරක චෙක්පත් ලබා ගන්නා අතර, සංචාරයේ යෙදෙන අතරතුර දී එම ප්‍රදේශයේ වාණිජ බැංකුවකට එම සංචාරක චෙක්පත් ලබා දී නැවත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත. නිකුත් කිරීමේ දී බැංකුව විසින් සේවා ගාස්තුවක් අය කරනු ලබයි.

- **ස්වයංක්‍රීය බැංකු සේවා :**

  බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබා දී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නො ගොස් දවසේ ඕනෑ ම වේලාවක ලබා ගැනීමට හැකි වන සේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි. මෙ මගින් ගනුදෙනුකරුවන්ට බැංකුවලින් පහත සේවා ලබා ගත හැකි ය.

- **ණයවර ලිපි නිකුත් කිරීම**

  ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකග වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි.

චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි.

- චෙක්පත යන්න හඳුන්වයි
- චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව
- චෙක්පතක මූලික ලක්ෂණ
- චෙක්පත් වර්ග
- චෙක්පත් ලිවීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු
- චෙක්පත් රේඛනය
- චෙක්පත් රේඛන වර්ග
- චෙක්පත් පිටසන් කිරීම
- චෙක්පත් අගරු වීම

# චෙක්පත යන්න හඳුන්වයි

- ජංගම ගිණුම් හිමියකු (අණකරු) විසින් එහි සඳහන් මුදල නම සඳහන් පුද්ගලයාට (ආදායකයාට) හෝ ඊගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට (අණලදුට) කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පතක් ලෙස හැඳින්වේ.

**චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව :**

| | | |
|---|---|---|
| අණකරු | (Drawer ) - | ගිණුම් හිමියා |
| අණලදු | (Drawee ) - | ගිණුම පවත්වා ගෙන යන වාණිජ බැංකුව |
| ආදායකයා | (Payee ) - | චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයා, චෙක්පතෙහි සඳහන් මුදල ලැබීමට හිමිකම ලබන්නා |

## චෙක්පතක මූලික ලක්ෂණ




1. දිනය
2. බැංකුවේ නම හා ශාඛාවේ නම
3. ආදායකයාගේ නම
4. හෝ රැගෙන එන්නාට යන යෙදුම
5. චෙක්පතේ වටිනාකම අකුරෙන් හා ඉල්කමෙන්
6. ගෙවනු යන පදය
7. අණකරුගේ අත්සන
8. චුම්භක අක්ෂර හැඳුනුම් තීරය (මෙහි පිළිවෙලින් චෙක්පත් අංකය, බැංකුවේ අංකය, ශාඛාවේ අංකය හා ගිණුම් අංකය සඳහන් වේ )
9. චෙක්පතේ පිළිපත

## • චෙක්පත් වර්ග

ධාරක චෙක්පත් (හාරක චෙක්පත් ) (Bearer cheques)

චෙක්පතෙහි මුද්‍රිත ව ඇති "හෝ රැගෙන එන්නාට" යන පදය කපා නො හැර ඇති චෙක්පතකි. පිටසන් කිරීමකින් තොර ව හුදු භාර දීමෙන් ධාරක චෙක්පත පැවරිය හැකි අතර බොහෝ දුරට මුදල් නෝට්ටුවකින් ගනුදෙනු කිරීම හා සමාන වේ.

විධාන චෙක්පත් (Order cheques )

හෝ රැගෙන එන්නාට යන පදය කපා හැර හෝ ඒ වෙනුවට "විධානයට" යන්න ලියා ඇති චෙක්පත් වේ. මෙවැනි චෙක්පතක් පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය වේ. ධාරක චෙක්පතකට වඩා විධාන චෙක්පත්වල ආරක්ෂාව වැඩි ය.

# • චෙක්පත් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු.

- ලිවීමේ දී නො මැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතු ය.
- පිළිපතේ අදාළ විස්තර සටහන් කළ යුතු ය.
- ලිවීමේ දී සිදු වන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතු ය.
- එක ම භාෂා මාධ්‍යයක් භාවිත කළ යුතු ය.
- අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදිය යුතු ය.
- චෙක්පතකට යොදන දිනය හා එහි ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
- හිස් චෙක්පතකට අත්සන් නො යෙදිය යුතු ය.

## • චෙක්පත් රේඛනය

චෙක්පත් රේඛනය : (Crossing the cheques)


චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම චෙක්පත් රේඛනය කිරීම ලෙස හඳුන්වයි. චෙක්පතකට සම්බන්ධ ඕනෑ ම පාර්ශ්වයකට රේඛනයක් සිදු කළ හැකි අතර, යොදන ලද රේඛනයක් අවලංගු කළ හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.

# චෙක්පත් රේඛන වර්ග

- රේඛන වර්ග දෙකකි.
    - සාමාන්‍ය රේඛනය
    - විශේෂ රේඛනය

සාමාන්‍ය රේඛනය (General crossing )


වගන්ති සහිත ව හෝ රහිත ව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.




Activate Win
Go to Settings to

## විශේෂ රේඛනය : (Special crossing )

සරල සමාන්තර රේඛා දෙකක් සහිත ව හෝ රහිත ව චෙක්පතක මුහුණත හරහා වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය වේ. මෙවැනි චෙක්පත්, රේඛනයේ නම සඳහන් බැංකුවේ ගිණුමක තැන්පත් කළ යුතු ය.



## චෙක්පත පිටසන් කිරීම (Endorsement)

චෙක්පතෙහි මුහුණත සඳහන් වන ආකාරයට ම ආදායකයා සිය නම චෙක්පතෙහි පිටුපස ලිවීම චෙක්පත පිටසන් කිරීම ලෙස හැඳින්වේ. (චෙක්පත දරන ඕනෑ ම අයෙකු චෙක්පත පැවරීමේ දී ඔහුගේ නම ලිවිය යුතු ය. ) චෙක්පත නීත්‍යානුකූල ව පැවරූ බව සනාථ කිරීම පිටසන මගින් සිදු වේ.

## චෙක්පත් අගරු වීම (Dishonour of cheques )

ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම චෙක්පතක් අගරු වීම ලෙස හැඳින්වේ.

# විද්‍යුත් මුදල් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය

- විද්‍යුත් මුදල් යන්න හැඳින්වීම
- භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග
- විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ
- විද්‍යුත් මුදල් කාඩ්පතකට සම්බන්ධ පාර්ශව

# විද්‍යුත් මුදල් යන්න හැඳින්වීම

විද්‍යුත් මුදල් (E - money)

විද්‍යුත් ක්‍රමයට නැතහොත් පරිගණක ජාලයක් හරහා හුවමාරු වන මුදල් විද්‍යුත් මුදල් ලෙස සැලකේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට අරමුදල් මාරුවීමක් සිදු වේ. (Electronic Fund Transfer )

# භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග

විද්‍යුත් මුදල් වර්ග

- ණයපත් - Credit cards
- හරපත් - Debit cards
- පෙර ගෙවුම් කාඩ්පත් - Pre - paid cards
- ස්මාර්ට් කාඩ්පත් - Smart cards
- ක්ෂුද්‍ර පත් - Micro chips

# භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග හැඳින්වීම

- ණයපත්

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂය ණයපත් ලෙස හඳුන්වයි.

- හරපත්

බැංකු ගිණුම් හිමියෙකුට, තම ගිණුමේ ඇති මුදල් වෙළෙඳසැල් ගෙවීම් පියවීමට පැවරීම සඳහාත්, ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පත් විශේෂයකි. ගිණුමේ ඇති ශේෂය සඳහා පමණක් හරපත් හිමියාට ගනුදෙනු සිදු කළ හැකි ය.

- පෙර ගෙවුම් කාඩ්පත්

කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් විශේෂයකි. මුදල් හෝ චෙක්පත් වෙනුවට ආරක්ෂාකාරී මෙන් ම පහසු විද්‍යුත් ගෙවීම් ක්‍රමයකි. බැංකු ගිණුම් නො මැති අයට පවා පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය මගින් විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කළ හැකි ය.

- ස්මාර්ට් කාඩ්පත්

මෙය integrated circuit card එකකි. මෙහි මුදල් වටිනාකමක් සහිත chip එකක් අන්තර්ගත ය. මෙය භාවිත කර ගනුදෙනුවක් සිදු කළ විට එම ගනුදෙනුවේ වටිනාකම හර වී ශේෂය අඩු වේ. අදාළ නිකුතු ආයතනයට මුදල් ගෙවා වරින් වර මුදල් ගබඩා කර (Re-Loard ) ගත හැකි ය. ස්මාර්ට් කාඩ්පත මගින් ණයපතක, හරපතක, ATM කාඩ්පතක කාර්යයන් ද සිදු කළ හැකි අතර මෙය විද්‍යුත් මුදල් පසුම්බියක් (E-purse) ලෙස භාවිත කළ හැකි ය.

# විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ

මුහුණත




පිටුපස




- නිකුත් කරන ආයතනයේ නම හා ලාංඡනය
- කාඩ්පත් වර්ගය

  නිදසුන් : (Debit card, Credit card , ATM card )
- කාඩ්පත් අංකය
- සන්නාම ලාංඡනය (Brand Lago )

  නිදසුන් : VISA , Master
- කල් ඉකුත් වන දිනය
- කාඩ්පත් හිමියාගේ නම
- කාන්දම් පටිය (Magnetic stripe)
- අත්සන් පටිය (Signature stripe)
- කාඩ්පත් ආරක්ෂිත සංකේතය ( card security code )
- ත්‍රිමාන චිත්‍රය (Holo gram)
- නිකුතු ආයතනයේ නම , ලිපිනය හා කොන්දේසි
- ගනුදෙනුකරු සේවා දුරකථන අංකය : (customer service hotline)

# • විද්‍යුත් මුදල් කාඩ්පතකට සම්බන්ධ පාර්ශව.

- කාඩ්පත් හිමියා
- කාඩ්පත් නිකුත් කරන ආයතනය
- වෙළෙන්දා හෙවත් විකුණුම්කරු
- ණයපත් සංගමය

  නිදසුන් :

  වීසා, මාස්ටර්, ඇමරිකන් එක්ස්ප්‍රස් (AMEX)

2015 A/L

01) පහත දැක්වෙන්නේ රටවල් කිහිපයක භාවිතා කරන මුදල් වර්ග ලැයිස්තුවකි.

| රට | මුදල් වර්ගය |
|---|---|
| A. ඉතාලිය<br>B. ඕස්ට්‍රේලියාව<br>C. දකුණු කොරියාව<br>D. මැලේසියාව | 1. වොන්<br>2. ඩොලර්<br>3. රින්ගිට්<br>4. යූරෝ |

එක් එක් රටෙහි භාවිත වන මුදල් වර්ගය නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A – 1, B – 2, C – 3, D – 4    (2) A – 2, B – 1, C – 3, D – 4

(3) A – 3, B – 2, C – 2, D – 4    (4) A – 4, B – 2, C – 1, D – 3

(5) A – 4, B – 2, C – 3, D – 1

02. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරන කාර්ය කිහිපයකි.

A - මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම

B - රාජ්‍ය ණය කලමනාකරණය

C - විදේශ විනිමය පාලනය

D - රජයේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කිරීම

E - සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය

F - ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් යනාදිය සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් කාර්ය අතුරෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටු කරන නියෝජ්‍යායතන කටයුතු දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, D, F (3) A, B, D, F (4) B, C, D, E

(5) B, C, E, F (............)

03. (අ ) දානම, මුදල (අකුරෙන් හා ඉලක්කමෙන්) සහ අත්සන නිවැරදිව මුදල චෙක්පතක සඳහන් කර තිබුණ ද බැංකු අයකැමි විසින් එම චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. එලෙස මුදල නොගෙවීමට හේතුවිය හැකි කරුණු **හතරක්** ලියන්න.

(ආ) වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයෙන් සේවා සපයනු ලැබේ. එවැනි සේවා හතරක් කෙටියෙන් විස්තර කරන්න.

වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයෙන් සේවා සපයනු ලැබේ. එවැනි සේවා හතරක් කෙටියෙන් විස්තර කරන්න.

04. (අ ) " සමූපාකාර ග්‍රාමීය බැංකුවක් වෙනත් වාණිජ බැංකුවකින් වෙනස් නොවේ." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ ) ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සමාගම්වල සීඝ්‍ර වර්ධනයක් වර්තමානයේ දක්නට ලැබේ. එසේ මූල්‍ය සමාගම් සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු හතරක් දක්වන්න.

Activate

## 2016 A/L

01. ස්වයංක්‍රීය බැංකු සේවා (Automated Banking services) තුළින් බැංකුවකට පමණක් අත් වන වාසියක් වන්නේ,

(1) කාලය ඉතිරි කර ගැනීමට හැකි වීමයි.

(2) සේවා ව්‍යාප්තියෙන් වැඩි ලාභයක් ලැබීමට හැකි වීමයි.

(3) බිල්පත් ගෙවීම පහසු වීමයි.

(4) ගිණුම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබාගත හැකි වීමයි.

(5) ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමට හැකි වීමයි.

02. (ආ) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහබැංකුව විසින් ණය සීමා පැනවීමේ අරමුණු දෙකක් පැහැදිලි කරන්න.

# 2017 A/L

01. පහත සඳහන් දෑ අතුරින් තැන්පතු භාර ගැනීමට නොහැකි මූල්‍ය ආයතන වර්ගය වන්නේ

(1) ඒකක භාර ය.
(2) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ය.
(3) බලපත්‍රලාභී විශේෂිත බැංකු ය.
(4) ප්‍රාදේශීය සංවර්ධන බැංකු ය.
(5) බලපත්‍රලාභී වාණිජ බැංකු ය.

02. පහත සඳහන් දෑ අතුරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු සුපරීක්ෂණයට යටත් වන ආයතන වර්ග සංඛ්‍යාව කීයද?

A - බලපත්‍රලාභී වාණිජ බැංකු
B - බලපත්‍රලාභී විශේෂිත බැංකු
C - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
D - සමූපාකාර ග්‍රාමීය බැංකු ය.
E - සකසුරුවම් හා ණය දෙන සමූපාකාර සමිති

(1) 1 කි (2) 2 කි (3) 3 කි (4) 4 කි (5) 4 කි

03. පහත දැක්වෙන්නේ විද්‍යුත් ණය කාඩ්පතක සඳහන් මූලිකාංග කිහිපයකි.

A - ණයපත් සංගමයේ ලාංඡනය

B - කාඩ්පතේ අංකය

C - චුම්බක පටිය

D - කාඩ්පත් හිමියාගේ නම

E - සේවා දුරකථන අංකය

F - කල් ඉකුත්වන දිනය

G - අත්සන් පටිය

ඉහත දෑ අතුරෙන් විද්‍යුත් ණය කාඩ්පතක මුහුණතෙහි සඳහන් මූලිකාංග පමණක් ඇතුළත් කාණ්ඩය කුමක්ද?

(1) A,B,E,F (2) A,B,D,F (3) B,C,E,G (4) C, E,F,G (5) D,E,F,G (.........)

04. iii) (අ) චෙක්පතක් රේඛනය කිරීම තුළින් අණකරුවෙකු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු දෙකක් සඳහන් කරන්න.

iv) ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තාව (2016) ට අනුව ණය කාඩ්පත් භාවිතය රටේ මුළු ජනගහනයෙන් 6% කට ආසන්න ප්‍රමාණයකි.

(අ) ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය අඩු මට්ටමක පැවතීමට හේතු 02ක් සඳහන් කරන්න.

(ආ) ණය කාඩ්පත් භාවිතය වැඩි කිරීමට බැංකු කරුවකුට අනුගමනය කළහැකි උපාය මාර්ග 4ක් සඳහන් කරන්න.

v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල අධීක්ෂණ කටයුතු කිරීම ගනුදෙනු කරුවන්ට හිතකර ලෙස බලපාන ආකාර දෙකක් පැහැදිලි කරන්න.

# 2018 A/L

01. මෙහි දැක්වෙන වගුවේ X තීරුව මගින් විවිධ මුදල් වර්ග ද, Y තීරුව මගින් ඊට අදාළ නිදසුන් කිහිපයක් ද දැක්වේ.

මුදල් වර්ග හා උදාහරණ නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

| X | Y |
|---|---|
| A.විද්‍යුත් මුදල් | 1. භාණ්ඩාගාර බිල්පත |
| B.ආසන්න මුදල් | 2. රංතු |
| C.ව්‍යවහාර මුදල් | 3. ඉල්ලුම් තැන්පත් |
| D. බැංකු මුදල් | 4. කාසි හා නෝට්ටු |
| E. ද්‍රව්‍ය මුදල් | 5. ණය කාඩ්පත් |

(1) A - 1, B - 3, C - 2, D - 4, E - 5
(2) A - 2, B - 4, C - 3, D - 1, E - 5
(3) A - 2, B - 1, C - 4, D - 3, E - 5
(4) A - 5, B - 3, C - 4, D - 1, E - 2
(5) A - 5, B - 1, C - 4, D - 3, E - 2

(..........)

02. වාණිජ බැංකුවක් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

A - පොලියක් ලබා ගැනීමට හැකි වීම.

B - චෙක්පත් තැන්පත් කිරීමට හැකි වීම.

C - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම.

D - ණයපත් ලබා ගැනීමට හැකි වීම.

E - ඇයිරා පහසුකම් ලබා ගැනීමට හැකි වීම.

ඉහත දෑ අතුරෙන් ඉතිරිකිරීමේ ගිණුම් හිමියෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් ගණන,

(1) 1කි. (2) 2කි. (3) 3කි. (4) 4කි. (5) 5කි. (.........)

03. iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා හතරක් විස්තර කරන්න.

v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන්ම අවාසි ද සිදුවේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි දෙක බැගින් දක්වමින් තහවුරු කරන්න.

Ac

# 2019 A/L

01. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන ගුණාත්මක ණය පාලන ශිල්පීය ක්‍රමයක් වනුයේ,

(1) ණය සඳහා උපරිම පරිණත කාල සීමාවක් නියම කිරීම ය.

(2) වාණිජ බැංකු වෙත සපයන ණය සඳහා පොලී අනුපාතය ඉහළ දැමීමය.

(3) ණයවර ලිපි නිකුත් කිරීමේදී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම ය.

(4) වාණිජ බැංකු විසින් ලබාදෙනු ලබන ණය ක්ෂේත්‍ර සීමා කිරීම ය.

(5) ණය සඳහා උපරිම ණය සීමා පැනවීම ය.

(..........)

02. ණය කාඩ්පත හා සැසඳීමේ දී හර කාඩ්පත භාවිතයෙහි ඇති වාසියක් වනුයේ,

(1) මුදල් භෞතික වශයෙන් රැගෙන යා යුතු නොවීම ය.

(2) ප්‍රමාද වී ගෙවීමට හැකි වීම ය.

(3) කාඩ්පත් හිමියා ණයකරුවකු බවට පත් නොවීම ය.

(4) මුදල් ගෙවීම සඳහා කාඩ්පත් ඉදිරිපත් කළ යුතු වීම ය.

(5) ගිණුමේ මුදල් නොමැති වුව ද භාණ්ඩ මිල දී ගත හැකි වීමය.

(..........)

03. "ධාරක චෙක්පත්" "විධාන චෙක්පත්" හා සසඳන්න.

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."